**<u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හි පළමු මාස 06 තුල ගුවන් ගමන් වාර සියයට 16ක වර්ධනයක්..</u>**

2024 වසරට සාපේක්ෂව 2025 වසරේ ගුවන්ගමන් වාර වල සියයට 16ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. ජාත්‍යන්තර ගුවන්ගමන් වාරවල සියයට 17 ක පමණ වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර දේශීය ගුවන්ගමන් වාරවලද සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. ජාත්‍යන්තර ගුවන් ගමන් වාර වල වර්ධනයේ වැඩිම අගය මාර්තු මාසයේ පෙන්නුම් කරනු ලබන අතර එය 2024 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව සියයට 22 කි. දේශීය ගුවන් ගමන් වාර වර්ධනයේ වැඩිම අගය ජූනි මාසයේ පෙන්නුම් කරනු ලබන අතර එය 2024 වසරට සාපේක්ෂව සියයට 38 වර්ධනයකි. ඉදිරි සංචාරක සමය ආරම්භයත් සමග ගුවන් ගමන් වාර තව දුරටත් පුළුල් කිරීමට බලාපොරොත්තු වන බව ගුවන් තොටුපොල අධිකාරිය පවසයි.

මාධ්‍ය අංශය -

ප්‍රවාහන,මහාමාර්ග,වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය.